**ජාතික මෝස්තර මධ්‍යස්ථානය - 2019**

**-----------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මධ්‍යස්ථානයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මධ්‍යස්ථානය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය
-------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.
---------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 13 (අ) සහ (ආ) අනුව එක් වාර්තාකරණ කාල පරිච්ඡේදයකට වැඩි කාලයක් තුළ භාවිතා කිරීමට අපේක්ෂිත ස්පෘශ්‍ය වත්කම් දේපළ පිරියත හා උපකරණ යටතේ දැක්විය යුතු වුවත්, 2020 මැයි මස වන විටද වැඩ නිම කර භාවිතයට ගෙන නොමැති කෙරීගෙන යන වැඩ වටිනාකමක් වන එකතුව රු.60,117,201 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ ලෙස සටහන් කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මෙම ප්‍රමිතිය අනුව වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විලම්භිත අදායම් ලෙස රු.6,253,123 ක් සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ සටහන් කර තිබුණද, ඊට අදාළ වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මෙම ප්‍රමිතය අනුව ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) භාවිතයෙන් ඉවත් කරන ලද පරිගණක වල පිරිවැය වටිනාකම වත්කම් විකුණුම් ගිණුමට මාරු කිරීමේදී එම වටිනාකම රු.67,137 ක් අඩුවෙන් මාරු කර තිබූ අතර, ඉවත් කළ පරිගණක වලට අදාළ ක්ෂය වෙන් කිරීමද රු.387,357 ක් අඩුවෙන් ක්ෂය වෙන් කිරීමේ ගිණුමෙන් වත්කම් විකුණුම් ගිණුමට මාරු කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ වත්කම් විකිණීමේ අලාභය රු.320,220 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ඉවත් කළ වත්කම් වලට අදාළ නිවැරදි පිරිවැය හා ක්ෂය වෙන් කිරීම් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ පරිගණක සඳහා ක්ෂය ගණනය කිරීමේදී එම වටිනාකම රු.60,720 ක් අඩුවෙන් ගණනය කර ගිණුම්ගත කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ක්ෂය වෙන් කිරීම් නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.5 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ස්ථාවර වත්කම් | 94,611,771 | 76,233,036 | 18,378,735 | පිළිතුරු ලබාදී නැත | දීර්ඝ කාලයක සිට පැවත එන මෙම වෙනස්කම වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර ගිණුම් නිරවුල් කළ යුතුය. |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ | 7,424,463 | ශේෂ සනාථන ලිපි | පිළිතුරු ලබාදී නැත | ලැබිය යුතු ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ | 7,328,155 | ශේෂ සනාථන ලිපි | පිළිතුරු ලබාදී නැත | ගෙවිය යුතු බවට ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 1640 (ii) හා 1642 | හිටපු සභාපතිවරයා විසින් පාවිච්චි කරන ලද ඔහුගේ නිල මෝටර් රථයක් නිලධාරියා විදේශගතව සිටියදී ඔහුගේ පුතා විසින් පරිහරණය කර හදිසි අනතුරකට භාජනය වීම නිසා රථයට අලාභ සිදු වී තිබුණි. ඒ පිළිබඳව පොලීසියේ පැමිණිල්ලක් කර, මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමටත්, ඊට අදාළව ලිපිගොණු නඩත්තු කිරීමටත් කටයුතු කර නොතිබුණි. | සභාපතිවරයා විදේශගතව සිටියදී රථය සභාපතිවරයාගේ පුතා ගරාජයෙන් ඉවත් කිරීමට යාමේදී අනතුරට භාජනය වී ඇත. හදිසි අනතුර පිළිබඳව හිටපු සභාපතිවරයා ආයතනයට නිළ වශයෙන් දැනුම්දී නැත. එබැවින් පොලීසියේ පැමිණිලි කිරීම හෝ රක්ෂණ වන්දි ලබා ගැනීමට හැකියාවක් නොලැබුණි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව හදිසි අනතුර සම්බන්ධව ක්‍රියා කිරීමට සහ හදිසි අනතුර සඳහා ලිපිගොණුවක් නඩත්තු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XII වැනි සහ XV පරිච්ඡේද | නිලධාරියෙකු සංචාරයක් සඳහා විදේශගත වීමට මාස 03 කට පෙර නිවාඩු අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු වුවත්, මධ්‍යස්ථානයේ හිටපු සභාපතිවරයා පෞද්ගලික සංචාරයක් සඳහා විදේශගත වීමට දින 02 කට පෙර නිවාඩු ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කර තිබූ අතර, රටින් බැහැරව යාම සඳහා අග්‍රාමාත්‍යවරයාගේ අනුමැතියද ලබාගෙන නොතිබුණි. | නිවාඩු ඉල්ලුම්පත්‍රය මාස 02 කට පෙර ඉදිරිපත් කිරීමට නොහැකි විය. මේ නිසා අග්‍රාමාත්‍යතුමාගේ අනුමැතියද ලබා ගැනීමටද නොහැකි විය. | ආයතන සංග්‍රහය අනුව ක්‍රියා කළ යුතු අතර, විදේශගත වීමට පූර්ව අයදුම් කර නිවාඩු අනුමත කරගත යුතුය. |
| (ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ගත වීමට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ඈ) 2003 ඔක්තෝබර් 28 දිනැති පීඊඩී 17 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | විදේශ සංචාර සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අවසර ලබාගත යුතු වුවත්, එසේ අවසර ලබා ගැනීමකින් තොරව කළ විදේශ සංචාරයක් සඳහා එකතුව රු.179,800 ක් ගුවන් ටිකට් පත්, රක්ෂණ ගාස්තු සහ අනියම් වියදම් දීමනා ලෙස ගෙවීම් කර තිබුණි. | අමාත්‍යාංශය මඟින් අදාළ අනුමැතිය ලැබේය යන විශ්වාසය මත විදේශ ගමන සඳහා සහභාගී කරවන ලදී. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ඉ) 2019 අප්‍රේල් 02 දිනැති අංක MIC/HR/01/2019 දරන රේඛීය අමාත්‍යාංශ චක්‍රලේඛය | පූර්ව අවසර ලබා ගැනීමකින් තොරව පෞද්ගලික හෝ රාජකාරී කටයුතු සඳහා දිවයිනෙන් බැහැර නොවිය යුතු බවට අවධාරණය කර තිබුණද, එසේ අවසර ලබා ගැනීමකින් තොරව 2019 අප්‍රේල් 20 දින සිට 2019 මැයි 04 දින දක්වා දින 14 ක කාලයක් තුළ හිටපු සභාපතිවරයා විදේශගතවී තිබුණි. | හදිසි අවශ්‍යතාවය මත පූර්ව නිවාඩු ඉල්ලුම් කිරීමට නොහැකි වූ අතර, ඉතා හදිසි නොවැළැක්විය හැකි හේතුවක් පදනම් කරගෙන විදේශගත වීමට සිදු වී ඇත. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කර නිවාඩු අනුමත කරගෙන විදේශගත විය යුතුව තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.65,961 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,002,071 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,936,110 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා මුළු ආදායම රු.4,674,346 කින් අඩු වී තිබියදී සමස්ථ මෙහෙයුම් වියදම රු.11,642,296 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මධ්‍යස්ථානය විසින් මොරටුව නගර සභාව වෙත 2004 වර්ෂයට පෙර වර්ෂ වලට අදාළව ගෙවිය යුතු හිඟ වරිපනම් සහ අධිභාර ගාස්තු වල එකතු වටිනාකම රු.352,239 ක් විය. වර්ෂ ගණනාවක සිට පවතින මෙම හිඟ ණය ශේෂය නිරාකරණය කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | මෙම හිඟ මුදල 2004 වර්ෂයට පෙර කාලයට අයත් වේ. අදාළ හිඟ මුදල් පවතින ගැටලු නිරාකරණය වන තෙක් ආයතනය විසින් ගෙවා නොමැත. | හිඟ වරිපනම් මුදල් අධිභාර රහිතව ගෙවා පියවීමටත්, එසේ ගෙවා වට්ටම් ලබා ගැනීමටත් ක්‍රියා කළ යුතුය. |
| (ආ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු විගණිත 2020 මැයි 30 දින වන විටද පරිහරණය කළ හැකි තත්ත්වය දක්වා සම්පූර්ණ නොකිරීම හේතුවෙන්, මධ්‍යස්ථානයේ අධ්‍යාපන අංශය පවත්වාගෙන යාමට මසකට රු.84,975 ක කුළී පදනම මත ගොඩනැගිල්ලක් ලබාගෙන තිබුණි. ඒ වෙනුවෙන් 2019 වර්ෂය සඳහා එකතුව රු.1,019,700 ක්ද, 2020 වර්ෂය තුළ රු.339,900 ක්ද කුළී ලෙස ගෙවීම් කර තිබුණි. | ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වූ බැවින් කුළී ගිවිසුම් වරින් වර දීර්ඝ කිරීමට සිදු විය. ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් වන තෙක් සහ පුහුණු අංශය කුළී ගොඩනැගිල්ලෙන් ඉවත් කළ නොහැකි වී ඇත. මසකට රු.85,000 ක් බැගින් කුළී ගොඩනැගිල්ල තවදුරටත් ලබාදීමට එකඟ වී ඇති අතර, නව ගොඩනැගිල්ල භාවිතයට ගෙන දේශන පවත්වන ලද ගොඩනැගිල්ලේ දේශන පැවැත්වීමට සුදුසු වාතාවරණයක් ඇති කරන තෙක් කුළී ගොඩනැගිල්ල භාවිතා කිරීමට සිදුව ඇත. | නව ගොඩනැගිල්ල තුළ කඩිනමින් කාර්යාලය ස්ථාපිත කර කුළී ගොඩනැගිල්ල ආපසු භාරදීමටත් කුළී වියදම් අඩු කර ගැනීමටත් ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති අංක 10, ද මෙල් පාර, කටුබැද්ද යන ස්ථානයේ ඇති ඉඩමේ අයිතිය පවරා ගැනීමකින් තොරව 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු.60,117,201 ක් වැය කර නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කර තිබුණද, වායු සමීකරණ සවි නොකිරීම නිසා එය 2020 මැයි මස දක්වා ඵලදායී කාර්යයකට භාවිතා කළ නොහැකි බව නිරීක්ෂණය විය. | මෙම ඉඩම රේඛීය අමාත්‍යාංශයේ මැදිහත් වීම මත දිගුකාලීන බදු පදනමට ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ඉදිකිරීම් සිදු කිරීමට පෙර ඉඩම නීත්‍යානුකූලව පවරාගත යුතුව තිබුණි. |
| (ඈ) ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රෙදිපිළි, ලෙදර් හා රෙක්සින් පාඨමාලාව සම්පූර්ණ කළ, වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්කවල පුහුණු ප්‍රතිලාභීන්ට බෙදාදීමට මහන මැෂින් 199 ක් 2018 අප්‍රේල් මස මිලදීගෙන තිබුණි. නමුත් මෙම මහන මැෂින් වලින් මැෂින් 101 පුහුණු ලාභීන්ට බෙදාදීම 2019 සැප්තැම්බර් 20 දින දක්වා දින ප්‍රමාදවී සිදු කර තිබූ අතර, ඉතිරි මහන මැෂින් 98 ක් බෙදාදීම 2020 පෙබරවාරි මස 28 දින දක්වා ප්‍රමාද කර සිදු කර තිබුණි. | අමාත්‍යාංශය හරහා මහන මැෂින් බෙදා දීමට දින ලබා ගැනීමේදී වූ ප්‍රමාදය නිසා මැෂින් බෙදා දීමට ප්‍රමාද විය. | ව්‍යාපෘතිය යටතේ පූර්ව සැලසුම් කළ පරිදි නියමිත දින පුහුණුව අවසන් කළ විගස මහන මැෂින් බෙදා දිය යුතුව තිබුණි. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකවරයා, අධ්‍යක්ෂක මණ්ඩලයේ ලේකම්වරයා ලෙස කටයුතු කර තිබුණි. 2019 මාර්තු 11 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී මාස 03 ක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය සහිතව මෙම තනතුර සඳහා බඳවා ගන්නා ලෙස උපදෙස් ලබාදී තිබුණි. උපදෙස් ලබාදී වසරකට | බඳවා ගන්නා තෙක් බාහිර අයෙකුගේ සේවය ලබා ගන්නා ලෙසට උපදෙස් ලබාදී ඇත. | පොදු ව්‍යාපාර කාරක සභා උපදෙස් පරිදි ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වැඩි කාලයක් ගතවී තිබුණද, 2020 මැයි 30 දින දක්වා එම උපදෙස් ප්‍රකාරව බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යනු ලබන ඩිප්ලෝමා මට්ටමේ පුහුණු වැඩසටහන් පැවැත්වීමේ අරමුණ යටතේ 2019 වර්ෂයේදී අපේක්ෂිත ශුද්ධ ආදායම රු.1,000,000 ක් වුවද, වර්ෂය තුළ එකතුව රු.528,000 ක ශුද්ධ ආදායමක් ලබාගෙන තිබුණි. ඒ අනුව අදාළ අරමුණ ලබා කර ගැනීමේ මූල්‍ය ප්‍රගතිය සියයට 53 ක් බව නිරීක්ෂණය විය. | සිසුන් 70 දෙනෙකු බඳවා ගැනිමට සැලසුම් කළ ද දේශන ශාලා ඉඩකඩ ප්‍රමාණවත් නොවීමේ ගැටලු මත සිසුන් 60 ක් බඳවා ගත් අතර, ඒ අනුව ඉලක්ක ආදායම ලබාගත නොහැකි විය. | ලබා කරගත හැකි ඉලක්ක ස්ථාපිත කිරීමටත්, ඉලක්ක අනුව පුහුණු පාඨමාලා පැවැත්වීමටත් ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | මෝස්තර සහ භාණ්ඩ නිෂ්පාදන අමුද්‍රව්‍ය සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම සහ අමුද්‍රව්‍ය සඳහා ප්‍රමිති සහතික නිකුත් කිරීම යන කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.1,040,000 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන මුදලක් වෙන් කර තිබූ නමුත්, වර්ෂය තුළ ඉටු කළ කාර්යයන් සඳහා දරන ලද සත්‍ය වියදම රු.330,000 ක් විය. ඒ අනුව එහි මූල්‍ය ප්‍රගතිය සියයට 32 ක් විය. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව එහි භෞතික ප්‍රගතිය සියයට 33 ක් විය. | මෙම අංශයේ සේවය කළ සහකාර අධ්‍යක්ෂක (යාන්ත්‍රික) නිලධාරියාගේ කොන්ත්‍රාත් සේවා කාලය අවසන් වී ඔහු ඉවත් වී යාමත්, සහකාර අධ්‍යක්ෂක (රසායනික) නිලධාරිනිය ප්‍රසූත නිවාඩු ලබා ගැනීමත් නිසා අපේක්ෂිත පර්යේෂණ දෙකක් අවසන් කිරීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්ම සහ ආයතනය පිහිටුවීමේ පනතේ පවරා ඇති අරමුණු ලබා කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) මූල්‍ය දායකත්වය යටතේ 2014 දෙසැම්බර් මස සිට 2016 දෙසැම්බර් මස දක්වා වූ වසර 02 ක කාලයක් තුළ ශිල්පීන්ගේ තාක්ෂණික හැකියාව සංවර්ධනය සහ උපදේශක සහය ලබාදීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. 2019 වර්ෂය වන විට මෙම ව්‍යාපෘති කාලය අවසන් වී වසර 03 ක කාලයක් ගතවී තිබුණද, එම ව්‍යාපෘතිය සඳහා ලැබූ මුදල් භාවිතා කර 2019 වර්ෂය තුළද එකතුව | පිළිතුරු ලබාදී නොමැත. | ව්‍යාපෘතිය මඟින් ශිල්පීන් වෙත ලබා දීමට සැලසුම් කළ තාක්ෂණික හැකියාවන සහ උපදේශන සේවා සැලසුම් කළ පරිදි ඉටු කිරීමට ක්‍රියා කළ යුතුය. |

රු.2,321,916 ක ගෙවීම් සිදු කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය යටතේ අරමුණු කළ ඵලදායී කාර්යයකට යොදා නොගෙන බැංකු ජංගම ගිණුමක නිෂ්කාර්යාව එකතුව රු.2,321,228 ක මුදලක් පැවතුණි.

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) වගන්තිය ප්‍රකාරව 2019 අගෝස්තු මස මහනුවරදී පවත්වන ලද යුගයට නිමවුම් ප්‍රදර්ශනයට අදාළ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුමකට ඇතුළත්විය යුතු වුවත්, එවැනි ගිවිසුමකට එළඹී නොතිබුණි. | කොන්ත්‍රාත් ප්‍රදානය කරනු ලබන අවස්ථාවේදී අතපසු වීමකින් ගිවිසුමක් අත්සන් කර ගැනීමට කටයුතු කර නොමැත. | ප්‍රසම්පාදන නීති රීති වලට අනුකූලව කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14.1 වගන්තිය ප්‍රකාරව නියමිත කොන්ත්‍රාත් කාල සීමාව ඉක්මවා ඉදිකිරීම් සිදු කරන්නේ නම් අධිකාරී බලයලත් පුද්ගලයෙකු විසින් එම කාලය දීර්ඝ කිරීම සඳහා අවසරය ලබාදිය යුතු විය. මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලබාදී තිබූ දින 270 ක කාලය ඉක්මවා කාලය දීර්ඝ කිරීමට ලබාදුන් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකරන ලදී. | ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත් කාලය දින 270 කි. නමුත් පාලනය කළ නොහැකි විවිධ හේතූන් මත කාලය දීර්ඝ කිරීමට සිදුවිය. ඒ අනුව නියමිත කාලය ඉක්මවා ඉදිකිරීම් කටයුතු සිදු කළ අතර, එය උපදේශන ආයතන නිලධාරියෙකු විසින් සිදු කරන ලදී. | ප්‍රසම්පාදන නීති රීති වලට අනුකූලව අධිකාරී බලයලත් පුද්ගලයෙකු විසින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට ක්‍රියා කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට මධ්‍යස්ථානයේ අනුමත කාර්ය මණ්ඩලය 113 ක් වුවත්, සත්‍ය කාර්ය මණ්ඩලය 87 ක් විය. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය, සත්‍ය කාර්ය මණ්ඩලය සමඟ සැසඳීමේදී ජ්‍යෙෂ්ඨ, ද්විතීය සහ තෘතීය මට්ටමේ කාර්ය මණ්ඩලවල 26 දෙනෙකුගේ ඌනතාවයක් පැවතුණි. මෙම සේවක මණ්ඩල ඌනතාව මුළු අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 23 ක් විය. 2018 වර්ෂයේ සිටම පැවති එම තනතුර සඳහා බඳවා ගැනීමට ක්‍රියා නොකිරීම නිසා එය ආයතනයේ අභ්‍යන්තර විගණන වැනි අංශ අක්‍රීය වීමට හේතුවී තිබුණි | පසුගිය කාලය තුළ ඇති වූ මැතිවරණ හා විවිධ හේතූන් මත පුරප්පාඩු තනතුරු සඳහා සැලසුම් කළ පරිදි බඳවා ගැනීමට නොහැකි විය. | ආයතනයේ පවතින අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 23 ක සේවක ඌනතාවය සම්පූර්ණ කිරීමට ක්‍රියා කළ යුතුය. |

# 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම 2019 පෙබරවාරි මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබූ නමුත්, 2019 ජූලි 01 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී 2019 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රමාද වී සංශෝධිතව අනුමත කර තිබුණි. | 2019 ක්‍රියාකාරී සැලැස්ම පෙබරවාරි මස අනුමැතියට ඉදිරිපත් කළ අතර, එය ජූලි මස සංශෝධිතව අනුමැතිය ලබා ගන්නා ලදී. | ක්‍රියාකාරී සැලැස්ම පූර්ව වර්ෂයේදී සකස් කර නව වර්ෂය එළඹීමට පෙර චක්‍රලේඛයන් ප්‍රකාරව ඉදිරිපත් කර අදාළ අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) ක්‍රියාකාරී සැලැස්ම අනුව මෝස්තර උපදේශක සේවා සැපයීමේ අරමුණ යටතේ අපේක්ෂිත ආදායම රු.500,000 ක් ලෙස දක්වා තිබුණද, වර්ෂය අවසානය වන විට එම ආදායම රැස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා උපදේශන සේවා නොමිලේ සපයා ඇති බැවින් කාර්ය සාධන වාර්තාව අනුව මූල්‍ය ප්‍රගතියක් සටහන් කළ නොහැකි විය. | ක්‍රියාකාරී සැලසුම් ප්‍රකාරව අපේක්ෂිත ආදායම් රැස් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පුරප්පාඩු වී තිබූ අභ්‍යන්තර විගණක තනතුර සඳහා 2019 ජූලි මස සේවකයෙකු බඳවාගෙන තිබුණි. නමුත් අභ්‍යන්තර විගණනය සඳහා තවත් එක් නිලධාරියෙකු බඳවාගෙන අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීමට පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ආයතනයේ අභ්‍යන්තර විගණකවරයෙකු පමණක් සිටින අතර, අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා එම අංශය සඳහා නිලධාරීන් යෙදවීමට ක්‍රියා කළ යුතුය. |

**4.3. අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයයන් 04 කට අදාළව සත්‍ය වියදම ඇස්තමේන්තුගත වියදම සමඟ සැසැඳීමේදී, ඇස්තමේන්තුගත වියදම ඉක්මවා වියදම් දැරීම් සියයට 23 සිට සියයට 19 දක්වා වූ පරාසයක විහිදී පැවතුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අයවැය ලේඛනයට අනුව ඉලක්ක කළ වාර්ෂික වැය සීමාව තුළ පාලනයකින් යුතුව වියදම් දැරීමට ක්‍රියා කළ යුතුය. |